# කොළඹ සංවර්ධන කටයුතු නොකඩවා කරගෙන යා හැකි පිරිසක් නගර සභාවට පත් කරන්න

## පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ කියයි



කොළඹ නගරයේ දැනට සිදුවන සංවර්ධන කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙනයා හැකි මහ නගර සභාවක් කොළඹට පත්කළ යුතු බව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා පැවසීය. මොරගොඩ මහතා ඒ බව ප්‍රකාශ කළේ ජනතාවගේ ගැටළු පිළිබඳව තොටළඟ ඇපල්වත්ත ප්‍රදේශයේ පැවැති සාකච්ඡාවකදීය.

තොටළඟ ප්‍රදේශයේ ගෙන්ගෙට යමින් ජනතා ප්‍රශ්න ගැන විමසා බැලූ මොරගොඩ මහතා නගර සභාව හා මධ්‍යම රජය අතර බල අරගලයකට පාර කැපුණොත් ඉන් හානිය සිදුවන්නේ කොළඹ නාගරික සංවර්ධනයට බව අවධාරණය කළේය.

තමන් බලයට පත් වූ පසු දින 100 ක් තුළ කොළඹ මහ නගර සභා බලප්‍රදේශයේ ජනජීවිත නගා සිටුවීමට දොළොස් වැදෑරුම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බවද හෙතෙම පැවසීය. නාගරික සංවර්ධනයට සමගාමීව කොළඹ ජනතාවගේ පෞද්ගලික ආර්ථිකය ශක්තිමත් කිරීම ගැන සන්ධාන ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් කරුණු දක්වා ඇතැයි කී මිලින්ද මොරගොඩ මහතා දරුවන්ට හා තරුණයන්ට තම පාලනය යටතේ උපරිම මෙහෙවරක් සිදු කෙරෙන බව කීය.

දැනට කොළඹ නගරයේ වතු 1614ක පමණ ලක්ෂ සංඛ්‍යාත දිළිඳු ජනතාවක් වෙසෙති. අද පැල්පතේ ජීවත්වන ඔබට හෙට මහල් නිවසක් ලබාදීමට රජය සැලසුම්කර ඇතැයි සඳහන් කළේය. කොළඹ නගරයේ ශ්‍රම හමුදාව නගරයේම රඳවා ගන්නා අතර නගරයෙන් ජනතාව පිටමං කෙරෙන සංවර්ධනයකින් පලක් නොවන බවද කීය.

මෙම ජන හමුවේදී ජනතාව තමන්ට බලපාන ප්‍රශ්න රැසක් මිලින්ද මොරගොඩ මහතාට ඉදිරිපත් කළේය. ඒවා සියල්ල අවධානයට ගෙන ලබන ඔක්තෝබරයෙන් පසුව විසඳා දීමට අවශ්‍ය කටයුතු සලස්වන වග ඔහු අවධාරණය කළේය.